*සැ. යු.*– 2006.04.28 දින පළවූ අංක 1,443 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,444 — 2006 මැයි 05 වැනි සිකුරාදා — 2006.05.05**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු … … … … | 498 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … | 501 |

*සැ. යු.*—(i) ලංකා විදුලිබල මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත 2006 අප්‍රේල් මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) විදුලිබල ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත් කෙටුම්පත 2006 අප්‍රේල් මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවත් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 මැයි මස 11 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 අප්‍රේල් මස 28 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිළධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිළධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිළධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථාද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරීවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත් වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරීන් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

5. යුද්ධ සේවා අනුග්‍රහය :

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින්ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම්ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු :

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම :

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මඟින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90 (1) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකෙරෙනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඩුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රේදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු – ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු

### මාතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාශවල ඇති විවාහ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශ තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුයි.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී /පුරුෂ දෙපක්ෂයට ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතුයි.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08 සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2006 ජූනි මස 06 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2006 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹ 11, කෙළින් වීදිය, අංක 280,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතර | වැලිගම | මිදිගම කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා වැලිගම් කෝරළේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, මාතර. |
| මාතර | වැලිගම | කොටවිල කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ වැලිගම් කෝරළේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | එම |

05-14

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු

### මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුයි.

02. මෙම තනතුරු සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතුයි.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2006 ජූනි මස 06 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2006 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹ 11,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | පස්බාගේ | හාරිස්පත්තුව කොට්ඨාසයේ මල්වාහින්න ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, මහනුවර. |

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | උඩුදුම්බර | උඩුදුම්බර කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් මහනුවර |
| -එම- | උඩුනුවර | උඩුනුවර හා යටිනුවර කොට්ඨාසයේ වටදෙනිය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | -එම- |
| -එම- | -එම- | උඩුනුවර යටිනුවර කොට්ඨාසයේ වෙලම්බඩ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | -එම- |
| -එම- | -එම- | උඩුනුවර යටිනුවර කොට්ඨාසයේ එළමල්දෙණිය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | -එම- |
| -එම- | ගඟවට කෝරළය | කඩවත් සතර හා ගඟවට කෝරළේ කටුගස්තොට ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | -එම- |
| -එම- | තුම්පනේ | තුම්පනේ කොට්ඨාසයේ දෙහිදෙනිය මඩිහේ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | - එම - |

05-12

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු

### අනුරාධපුරය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුයි.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/ පුරුෂ දෙපක්ෂයට ඉල්ලුම් කළ හැකිය

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතුයි.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

06. අධ්‍යාපන හා නෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2006 ජූනි මස 06 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2006 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹ 11, කෙළින් වීදිය, අංක 280,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අනුරාධපුරය | හොරොව්පතාන | දකුණු මහපොතාන කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ හුරුළු පළාත විවාහ (උඩරට/ සාමාන්‍ය)රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්/අනුරාධපුරය |
| එම | කැකිරාව | මාමිණියා කෝරළේ උප්පැන්න මරණ සහ කලාගම් පළාත කොට්ඨාසයේ විවාහ/ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | - එම - |
| එම | නොච්චියාගම | දුනුමඩලාව කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ නුවරගම් පළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | - එම - |
| එම | එම | ගාල දිවුල්වැව කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ නුවරගම් පළාත කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | - එම - |
| එම | තිරප්පනේ | දකුණු උලගල්ල කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ හුරුළු පළාත කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | -එම - |
| එම | ගලෙන්බිඳුනු වැව | සීවලීපුර කොට්ඨාසයේ උප්පැන්න,මරණ සහ හුරුළු පළාත කොට්ඨාශ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | - එම - |

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අනුරාධපුරය | නැගෙනහිර නුවරගම් පළාත | විජයපුර කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ නුවරගම් පළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම් අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් අනුරාධපුරය |
| එම | එම | නුවරගම් පළාත කොට්ඨාසයේ මැදවච්චිය ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | - එම - |

05-13

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු පොළොන්නරුව දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 60ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2006 ජූනි මස 06 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2006 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹ 11, කෙලින් වීදිය, අංක 280,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පොළොන්නරුව | තමන්කඩුව | දකුණු මැද පත්තුව කොට්ඨාසයේ උප්පැන්න සහ මරණ සහ තමන්කඩුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පොළොන්නරුව |

05-15

---

## රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය

### ලේකම් හා ගණකාධිකාරි තනතුර

රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමයේ ලේකම් හා ගණකාධිකාරි තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ගෙන් (ස්ත්‍රී/පුරුෂ) අයදුම්පත් කැඳවනු ලැබේ.

(i) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I පන්තියේ නිලධාරීන්,

(ii) කොළඹට සැතපුම් 30 ක් ඇතුළත ස්ථිරව පදිංචිව සිටිය යුතුය.

(iii) 2006.07.01 දිනට වයස අවුරුදු 53 ට අඩු විය යුතුය.

(iv) රාජ්‍ය සේවයේ අවුරුදු 15 කට නොඅඩු සේවාවක් තිබිය යුතුය.

(v) ඉල්ලුම්කරුවන්ට සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් වැඩ කිරීමේ හැකියාව තිබිය යුතුය.

(vi) ගිණුම් හා පරිපාලන කටයුතු පිළිබඳව සුදුසුකම් හා පළපුරුද්දක් ඇති සංගමයේ සාමාජිකත්වය දරන අය කෙරෙහි හා දෙමළ භාෂාව ගැන දැනුමක් ඇති අය කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

*තනතුරට අදාළ වැටුප* : තෝරාගත් අයදුම්කරුට රාජ්‍ය සේවයේදී ලැබූ වැටුප හා දීමනා ද ඊට අමතරව ඒකාබද්ධ වැටුපෙන් 50% ක අතිරේක දීමනාවක් ද ගෙවනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරු අවුරුදු 02 ක (දෙකක) කාලයක් සංගමයේ සේවය සඳහා ද්විතියනය පදනම මත බඳවාගනු ලැබේ. ඔහු විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ඇප ඔප්පුවක් මගින් රු. 10,000 ක රක්ෂණ ඇපයක් තැබිය යුතුය.

සියළු විස්තර සහිත අයදුම්පත් තමන්ගේ අත් අකුරින් සම්පූර්ණ කර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2006.05.31 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඩබ්. එල්. ටී. සුමතිරත්න,
සභාපති,
රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය.

2006 අප්‍රේල් මස 21 වැනි දින,
රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය,
අංක 65/1, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

05-72

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II වන පංතියේ II වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2006

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II වන පංතියේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2006 අගෝස්තු මස කොළඹ දී පවත්වනු ලැබේ. මෙම පරීක්ෂණය සඳහා අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 2006 ජුනි මස 05 වැනි දින බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. *විභාග පරිපාටිය.*– මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත :

| | | |
|---|---|---|
| i. | ක්‍රමසම්පාදන සංකල්පයන් සහ විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන, මූල්‍ය හා පරිපාලනය.................. | කාලය පැය 03යි, ලකුණු 100යි |
| ii. | ආර්ථික විශ්ලේෂණය සහ සංඛ්‍යානය.................. | එම |
| iii. | ව්‍යාපෘති සැලසුම් කිරීම .................. | එම |
| iv. | ඉංග්‍රීසි භාෂාව .................. | එම |

*සටහන.*_

(අ) සියලුම විෂයයන් සඳහා එකම වාරයකදී හෝ වෙන් වශයෙන් වාර කීපයක දී හෝ පෙනී සිටීමට නිලධාරියකුට අවසර ඇත.

(ආ) සාමාර්ථය සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකින්ම ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් සෑම අපේක්ෂකයෙකුම ලබාගත යුතුය.

03. *විෂයයන්*.–

(I) ක්‍රමසම්පාදන සංකල්පයන් සහ විධි ශාස්ත්‍රය, ක්‍රම සම්පාදන ආයතන, මූල්‍ය හා පරිපාලනය.

*පළමුවන කොටස.*–

(අ) ජාතික පරමාර්ථයන් හා ප්‍රමුඛත්වයන් සහ ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති රාමුව සහ වැඩ සටහනක්.

(ආ) ජාතික ක්‍රමසම්පාදනය සඳහා විධි ශාස්ත්‍ර ක්‍රමසම්පාදනයෙහි ලා ප්‍රධාන ගැටළු තැන්, පොදු සහභාගීත්වය, සම්පත් යෙදවීම හා බෙදා හැරීම, රාජ්‍ය නොවන සංවිධානවල කාර්ය භාරය.

(ඇ) ජාතික ක්‍රමසම්පාදන සඳහා දත්ත ස්වභාවය හා මූලාශ්‍ර, දත්ත හා ඒවා රැස්කිරීම, අර්ථ නිරූපනය ඉදිරිපත් කිරීම සහ විශ්ලේෂණය, ක්ෂේත්‍ර අධීක්ෂණය හා විමර්ශණය, ප්‍රජා විද්‍යා සංකල්ප, ආර්ථික විද්‍යා ප්‍රක්ෂේපන හා ප්‍රතිපත්ති විශ්ලේෂණය.

*දෙවන කොටස.*–

(අ) ආණ්ඩුවේ මුදල් රෙගුලාසි, 1 වැනි කාණ්ඩය ( X පරිච්ඡේදය හැර)

(ආ) ප්‍රවර්තන වර්ෂයේ ඇස්තමේන්තු, උදා:- අය- වැය ශීර්ෂ හා වැඩසටහන් යටතේ ඒවා සකස් කිරීම, මූල්‍ය ක්‍රම හා විසර්ජන පනත් සහ පරිපූරක ඇස්තමේන්තු.

(ඇ) කාර්යාල සහ ක්ෂේත්‍ර සංවිධානය සහ ක්‍රම

(ඈ) ආයතන සංග්‍රහයේ පරිච්ඡේද – I, II, III, IV, V, VI, VII, IX, XI, XII, XV, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII.

( II) *ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය.*–

(අ) නිපැයුම් හා බෙදා හැරීම් පිළිබඳ න්‍යායයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරවමින් ආර්ථික විද්‍යා මූල ධර්ම :

(ආ) මුදල්, බැංකු, ජාත්‍යන්තර මූල්‍ය ක්‍රම හා වෙළඳාම,

(ඇ) රාජ්‍ය මූල්‍ය, මුදල්, වාණිජ හා තීරුබදු ප්‍රතිපත්තීන් සහ අනිකුත් ප්‍රතිපත්තීන්,

(ඈ) ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය,

(ඉ) ආර්ථික සමාලෝචනය කිරීම,

(ඊ) ශිල්පීය පුහුණු හා නුපුහුණු මානව සම්පත් සහ විදේශාධාර ඇතුළු වෙනත් සම්පත් තක්සේරු කිරීම හා ඒවා උපයෝගීකරණය,

(උ) ආර්ථික, විද්‍යාත්මක සහ සමාජයීය පුරෝකථන,

(ඌ) ආර්ථික විශ්ලේෂණය සහ ක්‍රමසම්පාදනයෙහි හා උපයෝගී කර ගන්නා මූලික සංඛ්‍යාන සංකල්ප හා ක්‍රම,

(එ) ප්‍රතිලාභ/ පිරිවැය විශ්ලේෂණ මූලධර්ම.

(III) *ව්‍යාපෘති සැලසුම් කිරීම.* –

*(අ) සැලසුම් කිරීම.* – ව්‍යාපෘති හඳුනාගැනීම සහ නිර්වචනය කිරීම හා ව්‍යාපෘති සම්පාදන ප්‍රතිපත්ති සිද්ධාන්ත හා ස්ථාන තෝරා ගැනීම සහ තාක්ෂණය : පිරිවැය හා ප්‍රතිලාභ ඇස්තමේන්තු කිරීම : තාක්ෂණය මූල්‍ය සහ ආර්ථික විශ්ලේෂණය.

*(ආ) ව්‍යාපෘති කිරීම.*– ව්‍යාපෘති සහ වැඩසටහන් නිසියාකාරව සහ කාලීනව ක්‍රියාත්මක කිරීම : විස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ උපලේඛන සැකසීම : අධීක්ෂණය හා ප්‍රගති පාලනය හා සටහන් සම්බන්ධීකරණය සහ පසුවිපරම.

(IV) *ඉංග්‍රීසි භාෂාව.*–

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරියෙකුට සිය රාජකාරී පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන ඉංග්‍රීසි දැනුම මැනීම සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍රයකි.

04. මෙම පරීක්ෂණය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අපේක්ෂකයන් විසින් ස්වකීය අයදුම්පත්‍ර පිළියෙල කරගත යුතුය. අයදුම්පත්‍රය පිළියෙල කරගත යුත්තේ ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක මිස අන් කිසිම ප්‍රමාණයේ කඩදාසියක නොවේ. අංක 1 සිට 06 දක්වා මුල් පිටුවේ ද සෙසු කොටස් දෙවන පිටුවේ ද පිළියෙල කරගත යුතුය. එය සම්පූර්ණ කළ යුත්තේ අපේක්ෂකයා විසින් සිය අත් අකුරිනි.

05. අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් (ප්‍රාදේශීය, ලේකම් කාර්යාලයෙහි නම් ප්‍රාදේශීය ලේකම් මගින්.) 2006 ජුනි මස 05 දින හෝ ඊට පෙර, බත්තරමුල්ල, පැලවත්ත, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එව්ය යුතු අතර, ඉල්ලුම්පත්‍රය විභාග කොමසාරිස් ජනරාල් වෙත බහා එවනු ලබන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. විභාග සඳහා අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට පසුව ලැබෙන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කාර්යය සඳහා නව ප්‍රවේශක නිලධාරීන් විසින් තම අයදුම්පත්‍ර රාජ්‍ය භාෂාවෙන් හෝ තමන් සේවයට බඳවා ගන්නා ලද භාෂා මාධ්‍යය අනුව දෙමළ භාෂාවෙන්/ඉංග්‍රීසි භාෂාවෙන් හෝ පිළියෙල කොට ඉදිරිපත් කළ හැකි ය.

06. අයදුම්පත්‍ර පිළිගෙන ඇති අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනවා ඇත. ඒ හා සමගම විභාග පැවැත්වෙන දිනය සඳහන් පුවත්පත් දැන්වීමක් ද පළවනු ඇත. යම්කිසි විභාග අපේක්ෂකයෙකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින හතරකටවත් පෙර ප්‍රවේශ පත්‍රයක් නොලැබුනහොත් ඒ බැව් පහත සඳහන් විස්තර සමග බත්තරමුල්ල, පැලවත්ත, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, විභාග කොමසාරිස් ජනරාල්, (විදුලි පණිවුඩ ලිපිනය විභාග බත්තරමුල්ල) වෙත අප්‍රමාදව ලියා දැන්විය යුතුය.

(i) විභාගයේ නම :
(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම :
(iii) සම්පූර්ණ ලිපිනය :
(iv) ඉල්ලුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි අංකය සහ දිනය :

07. *අනන්‍යතාවය.–* අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතුරින් කුමක් වුවත් භාර ගැනේ.

i. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද වලංගු හැඳුනුම්පත්‍රයක්.
ii. වලංගු ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක් )

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීම හෝ නොපිළිගැනීමට හෝ විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

08. *විභාග ගාස්තු.–* මෙම විභාගයට පෙනී සිටින විභාග අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත ගාස්තු අය කෙරේ.

| *විභාග ගාස්තු .–* | *රු. ශ.* |
|---|---|
| (අ) පළමුවන වතාව සඳහා ගාස්තු අය නොකෙරේ | |
| (ආ) පළමුවන වතාවෙන් පසු සම්පූර්ණ විභාගය සඳහා | 115 0 |
| (ඇ) එක් විෂයයන් සඳහා | 75 0 |

අපේක්ෂකයාගේ අත්සන තබා නිසි පරිදි අවලංගු කළ ආදායම් මුද්දර මගින් ගාස්තු ගෙවිය යුතුය.

09. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් කෙරේ. මෙම ගැසට් පත්‍රයේ I කොටස (IIඅ) ඡේදය ආරම්භයේ පළ කරනු ලැබ ඇති විභාග අපේක්ෂකයන් සඳහා නීතිරීති මේ විභාගය සඳහා ද බල පැවැත්වේ.

10. මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර ඇති තමන්ගේ දෙපාර්තමේන්තු/කාර්යාලවල නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා දෙපාර්තමේන්තු/කාර්යාල ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය.

11. මෙම රෙගුලාසිවලට අඩංගු නොවූ යම් කරුණක් වේතොත් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා මණ්ඩලයේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියා කරනු ඇත.

එන්. මදනායක,
ලේකම්,
ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා මණ්ඩලය.

2006 අප්‍රේල් මස 20 වැනි දින,
ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා මණ්ඩලය,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

## අයදුම් පත්‍රය

### ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2006

[ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ]
සිංහල – 2
දෙමළ – 3
ඉංග්‍රීසි – 4
(අදාල අංකය කොටුව තුළ ලියන්න.)

01. නම
1.1 මුලකුරු සමග නම/Mr/Mrs/Miss :——————.
(*ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්*)
Mr. SILVA, B.A.
1.2 සම්පූර්ණ නම :——————.
(*සිංහලෙන් /දෙමළෙන්* )
1.3 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

02. කාර්යාලීය ලිපිනය :——————.
(*ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්*)
2.1 කාර්යාලීය ලිපිනය :——————.
(සිංහලෙන් /දෙමළෙන්)
2.2 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :——————.
(*ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්*)

03. ස්ත්‍රී/පුරුෂ භාවය 3. : 1 ස්ත්‍රී – 1, පුරුෂ – 0 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

3.3 ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

04. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II වැනි පන්තියේ II වන ශ්‍රේණියට අතුළත් වූ දිනය :——————.
(*නිත්‍ය වශයෙන් රාජකාරී භාරගත් දිනය සඳහන් කල යුතුය.*)

05. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ආදී ප්‍රවේශකයෙක් ද? *නැතහොත්* නව ප්‍රවේශකයෙක් ද ? :——————.

06. දෙපාර්තමේන්තුවේ නම (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් නම් එම කාර්යාලයේ නම .) :——————.
07. ගැසට් නිවේදනයේ 2 වන ඡේදය යටතේ ඉදිරිපත් වන විෂයයන්

i.
ii.
iii.
iv

08. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද ? :——————.
09. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම්, ගෙවන ලද විභාග ගාස්තු :——————.

සම්පූර්ණ විභාගය සඳහා රු 115 කි. එක් එක් විෂයයන් සඳහා නම් රු. 75 ක් බැගින් වටිනාකමට මුද්දර මෙම කොටුවේ අලවා තම අත්සන තබා අවලංගු කරන්න.

10. මෙම ඉල්ලුම් පත්‍රයේ අලවන මුද්දර මව්සින් අවලංගු කිරීමට පෙර වලංගු වූ ද, පාවිච්චි නොකරන ලද එවා බව ද ඉහත සඳහන් විස්තර නිවැරදි බව ද, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බව ද ප්‍රකාශ කරමි.

—————,
අපේක්ෂකයාගේ / අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :—————.

*සටහන.*– තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකුගේ, තමාගේ ප්‍රාදේශීය ප්‍රධානියාගේ ඉදිරිපිට දී අයදුම්කරු අත්සන් කළ යුතුය.

### අත්සන සහතික කිරීම

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/ නිලධාරිනියක වූ, මා පෞද්ගලික දන්නා හඳුනන............. මහතා/මහත්මිය/මෙනවිය ............වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

නම :—————,
පදවි නාමය :—————,
ලිපිනය :—————.

—————,
සහතික කරන්නාගේ අත්සන.

### දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,
(ii) අපේක්ෂකයා / අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුය.)

පදවි නාමය :—————,
දිනය :—————.

05 – 97

---

### අධ්‍යාපන අමාත්‍යාංශය

### පශ්චාත් උපාධි පාඨමාලා සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව නවසීලන්තය - 2007

පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව සහ අධි ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය යටතේ නවසීලන්ත රජය විසින් පිරිනමනු ලබන පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ශිෂ්‍යත්ව 2007 පෙබරවාරි මාසයේ ආරම්භ වීමට නියමිතය.

මේ යටතේ පිරිනැමෙන ශිෂ්‍යත්ව සංඛ්‍යාව 04 කි.

02. මෙම ශිෂ්‍යත්ව මගින් ලාංකික සිසුන්ට උසස් පාඨමාලා හැදෑරීමටත්, පර්යේෂණ කටයුතුවල නියැලීමටත් අවස්ථාව සැලසේ. අධ්‍යයන/පර්යේෂණ සාර්ථක අයුරින් නිමකර නැවත ශ්‍රී ලංකාවට පැමිණීමෙන් අනතුරුව මෙරටට වැදගත්, සැලකිය යුතු සේවයක් ලබාදේයයි බලාපොරොත්තු විය හැකි බුද්ධිමතුන් හට මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරේ.

03. *අධ්‍යයන ක්ෂේත්‍ර* –අධ්‍යයන ක්ෂේත්‍රයන් පිළිබඳව සීමා කිරීමක් නොමැත. එහෙත් පහත සඳහන් අධ්‍යයන ක්ෂේත්‍රයන් සඳහා ප්‍රමුඛතාව දෙනු ලැබේ.

| | |
|---|---|
| තිරසාර ග්‍රාමීය රැකීරක්ෂා | - (පශු සම්පත්, වන සංවර්ධන විද්‍යා ධීවර කර්මාන්තය සහ උද්‍යාන විද්‍යාව) |
| අධ්‍යාපනය | - (පූර්ව ළමාවිය අධ්‍යාපනය, ද්විභාෂාත්මක අධ්‍යාපනය, අධ්‍යාපන කළමනාකරණය) |
| මූලික සෞඛ්‍යය | |
| පාලනය | - (රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය අංශයේ කළමනාකරණය) |

වෙළඳාම සහ සංවර්ධනය

ගැටුම් වැළැක්වීම සහ නැවත ගොඩනැගීම

පාරිසරික අධ්‍යයනය

(Biosecurity, Quarantine,
සනීපාරක්ෂණය and Phytosanitary
Standards, ශාඛ/සත්ව සෞඛ්‍ය,

ආහාර ආරක්ෂණය, ආහාර තත්ව සහ ආහාර තාක්ෂණය

සංචාරක කළමනාකරණය, Eco-tourism

කෘෂි ව්‍යාපාරික සංවර්ධන (ආදායම් උත්පාදනය, නිෂ්පාදන ක්‍රියාවලීන් හා ග්‍රාමීය සේවාවන්)

4. *ශිෂ්‍යත්වය නතර කිරීම.*–අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, අදාළ බලධාරීන්ගේ නිසි අවසරයක් නොමැතිව පන්තිවලට හෝ නේවාසිකාගාරයට නොපැමිණීම, අධ්‍යයන කටයුතුවල ප්‍රගතියක් නොදැක්වීම, විභාගවලින් අසමත්වීම නිසා අදාළ බලධාරීන් හට ඕනෑම අවස්ථාවකදී ශිෂ්‍යත්වලාභියාගේ ශිෂ්‍යත්වය අවලංගු කළ හැක. එවිට ශිෂ්‍යත්වලාභියාට තමාගේම වියදමින් ශ්‍රී ලංකාවට නැවත පැමිණීමට නියම කිරීමට ද හැකිය.

5. *ශිෂ්‍යත්ව ප්‍රදාන නියමයන්.*–ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් වේ.

(අ) නවසීලන්තයට යාමට සහ අධ්‍යයන කටයුතු නිම කිරීමෙන් පසු ලංකාවට පැමිණීමට ශිෂ්‍ය අනුග්‍රාහක හෝ අනෙකුත් අනුමත ගුවන් ගමන් වියදම් ලබා දෙයි. ප්‍රදානය ලැබීමට කලින් ආරම්භ කරන ලද ගමන් සම්බන්ධයෙන් වූ වියදම් නැවත නොගෙවනු ඇත. ශිෂ්‍යත්වලාභියාගෙන් යැපෙන්නන්හට ද ගමන් වියදම් ගෙවනු නොලැබේ.

(ආ) පුද්ගලික යැපීම් දීමනාවක් ;

(ඇ) අනුමත කළ පාඨමාලා සහ විභාග ගාස්තු ;

(ඈ) අදාළ අවස්ථාවන්හිදී පොත් සහ උපකරණ සඳහා ප්‍රදාන ;

(ඉ) නවසීලන්තය තුළ සිදුකරනු ලබන අනුමත අධ්‍යයන චාරිකා සඳහා වූ වියදම් සඳහා ප්‍රදාන.

6. සාමාන්‍ය යෝග්‍යතාව සඳහා අවශ්‍ය සුදුසුකම්.–

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය ;

(ආ) වයස : 2006.05.21 දිනට වයස අවුරුදු 45 නොඉක්මවිය යුතුය ;

(ඇ) අදාළ අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයකින් අවම වශයෙන් දෙවන පෙළ (ඉහළ) විශේෂ උපාධියක් ලබා සිටිය යුතුය ;

(ඈ) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුය. මේ බව සනාථ කිරීම සඳහා IELTS හෝ TOEFL පරීක්ෂණවලට පෙනී සිට ඉහළ ලකුණු මට්ටමක් ලබා තිබිය යුතුය. අදාළ විභාග ප්‍රතිඵල මෙම අධ්‍යයන කටයුතු ඇරඹෙන දිනට මාස 24 නොඉක්මවූ ප්‍රතිඵල විය යුතුය.

(ඉ) අමාත්‍යාංශයක/දෙපාර්තමේන්තුවක, විශ්ව විද්‍යාලයක හෝ රාජ්‍ය අංශයේ ආයතනයක සේවයේ නිරතව සිටිය යුතු වෙති. (සටහන (**ii**) හා (**iii**) බලන්න.)

(ඊ) *අයදුම්කරුවන්*. –

සමගාමී වෙනත් ශිෂ්‍යත්වයක් නොදැරිය යුතුය.

පූර්ණකාලීනව පශ්චාත් ද්විතීයක අධ්‍යයනයේ නිරත නොවිය යුතුය.

එකම සුදුසුකම දෙවරක් ඇති නොවීම පිණිස අයදුම්කරුවන් එකම අධ්‍යයන මට්ටමේ හෝ එම මට්ටමේම වෙනත් සුදුසුකමක් සම්පූර්ණ කර නොතිබිය යුතුය. යෝජිත අධ්‍යයන මට්ටම දැනටමත් ඔවුන් ලබා තිබෙන සුදුසුකමට ඉහළ මට්ටමක සුදුසුකමක් විය යුතුය.
නවසීලන්තය හෝ ඕස්ට්‍රේලියානු රජයන් විසින් පිරිනමන ලද ශිෂ්‍යත්වයක් අත්හිටුවා නොතිබිය යුතුය.

*සටහන*

(i) පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවෝද ඉහත 06 (ඈ) අවශ්‍යතා සපුරා තිබිය යුතු වෙති.
(ii) තාවකාලික, අනියම් හෝ කොන්ත්‍රාත් පදනමක් යටතේ පත්වීමක් ලබා ඇති අයගේද සේවයේ යෙදී නැති අයදුම්කරුවන්ගේද අයදුම්පත් සලකා බලනු නොලැබේ.
(iii) නියමිත පශ්චාත් උපාධි සුදුසුකම් ලැබීමෙන් අනතුරුව තම සේවයෙහි ස්ථිර කිරීමේ පදනම මත පරිවාස සේවා කාලයක පසු වන අපේක්ෂකයින්ට මෙම ශිෂ්‍යත්ව සඳහා අයදුම් කළ හැකිය. එවැනි අවස්ථාවකදී මෙම කරුණ සඳහන් ප්‍රකාශයක් අයදුම්පතෙහි 15 වැනි කොටුවෙහි සඳහන් කළ යුතුය.

7. *අයදුම්පත්*

(අ) සෑම අයදුම්පතක්ම මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙළ කළ යුතුය.

(ආ) අයදුම්පත බහා එවන කවරයෙහි වම්පස ඉහළ කෙළවර පොදු "රාජ්‍ය මණ්ඩලීය පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව - නවසීලන්තය - 2007" යනුවෙන් පැහැදිලිව ලියා හෝ යතුරු ලියනය කර එවිය යුතුය.

(ඇ) අයදුම්කරුවකු විසින් එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

(ඈ) සෑම අයදුම්පතක් සඳහාම, ආපසු නොගෙවන රු. 10/- ක මුද්දරයක් ඇලවිය යුතු වේ. මෙම අගය සඳහා වූ මුද්දරයක් හෝ මුද්දර අයදුම්පතෙහි මේ සඳහාම වෙන් කර ඇති කොටුවේ අලවා, අයදුම්කරුගේ අත්සන යොදා අවලංගු කළ යුතුය.

(ඉ) සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත සිය ආයතන ප්‍රධානියා මගින් යොමු කර නොමැතිනම් එම අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙයින් ඔවුහු අයදුම්පතෙහි 15 වෙනි කොටුවේ සහතිකය නිසි පරිදි සම්පූර්ණ කළ යුතු වෙති.

(ඊ) ශ්‍රී ලංකා ජනරජයට හෝ රාජ්‍ය අංශයේ ආයතනය හෝ නියමිත කාල සීමාවක් සේවය කිරීමට ගිවිසුමකින් හෝ බැඳුම්කරයකින් හෝ බැඳී සිටින අයදුම්කරුවකු 2006.05.21 වන දින වන විට ගිවිසුමෙන් හෝ ඔප්පුවෙන් හෝ බැඳී සිටින සේවා කාලය සම්පූර්ණ කර සිටිය යුතු වේ. එම ගිවිසුම යටතේ වන අනෙකුත් බැඳීම් සියල්ලන්ගෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී සිටී නම් පමණක් එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් පිළිබඳව සලකා බලනු ලැබේ.

(උ) මෙම අයදුම්පතෙහි සඳහන් කිසියම් ප්‍රකාශයක්, තෝරා ගැනීමට කලින් වැරදි බව අනාවරණය වුවහොත් එම අයදුම්කරු නුසුදුස්සකු බවට පත් වේ. තෝරාගැනීමෙන් පසු එවැනි වැරැද්දක් අනාවරණය වුවහොත් ශිෂ්‍යත්ව ප්‍රදානය අවලංගු කරනු ඇත.

(ඌ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය :

` 2006.05.21 දින ප.ව. 4.00 දක්වා අයදුම්පත් භාරගනු ලැබේ. එම දිනයට පෙර අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත දැක්වෙන ලිපිනයට යොමු කළ යුතුය.

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
උසස් අධ්‍යාපන අංශය,
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ -07

(එ) නිසි මාර්ගයෙන් එවනු නොලබන්නා වූ, කිසියම් ආකාරයකින් අසම්පූර්ණ වූ හෝ ප්‍රමාද වී ලැබෙන්නා වූ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. *සම්මුඛ පරීක්ෂණය*.- සුදුසුකම් ලත් සෑම අයදුම්කරුවෙක්ම කොළඹ නියමිත ස්ථානයක නියමිත වේලාවක පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ. මෙම සම්මුඛ පරීක්ෂණයේදී තම අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත සහ තම යෝග්‍යතාව සනාථ කෙරෙන අනෙකුත් ලිපිලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ දරනු ලබන අනෙකුත් වියදම් ප්‍රතිපූරණය කරනු නොලැබේ.

*වැදගත්*.- මේ වසර සඳහා ECE අනුමත සහතික පත්‍රය ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

9. *වෛද්‍ය පරීක්ෂණය*.- තෝරාගනු ලබන අපේක්ෂකයෝ නවසීලන්තයෙහි අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමට සුදුසු ශාරීරික සහ මානසික යෝග්‍යතාවකින් යුතු බවට, නවසීලන්ත ආගමන සේවය විසින් පත් කෙරෙන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු වෙති.

10. *ශිෂ්‍යත්ව සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීම*.- ශිෂ්‍යත්වයක් සඳහා අපේක්ෂකයකුගේ නාම යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීම, ඔහුට/ඇයට ශිෂ්‍යත්වයක් ප්‍රදානය කිරීමක් ලෙස කිසිම අපේක්ෂකයකු විසින් නොසැලකිය යුතුය. නාමයෝජනා පිළිගැනීම හුදෙක්ම නවසීලන්ත අධිකාරීන්ගේ අභිමතය පරිදි සිදු වන්නකි.

තෝරාගනු ලැබූ අපේක්ෂකයකු තෝරා ගැනීමෙන් පසු නාමයෝජනාව ප්‍රතික්ෂේප කරයි නම් හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානය පිළිගැනීම ප්‍රතික්ෂේප කරයි නම්, අන් කවර හෝ ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා එම අපේක්ෂකයා පිළිබඳව අනාගතයේදී සලකා බලනු නොලැබේ.

11. *නිවාඩු*.- රජයේ නිලධාරීන්ට ශිෂ්‍යත්වය පිළිබඳව නිවාඩු ලබාදීම, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට සහ නිවාඩු ලබාගැනීම පිණිස අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදී බලපවත්නා දෙපාර්තමේන්තු නීති හා රෙගුලාසි විසින් පාලනය කෙරෙනු ඇත.

12. *ගිවිසුම*.- තෝරාගනු ලබන සෑම අපේක්ෂකයකුම ශිෂ්‍යත්වය සඳහා පිටත්ව යාමට පෙර ශ්‍රී ලංකා ජනරජය සමග පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹිය යුතුය.

(අ) නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය නිම කිරීමට.

(ආ) පාඨමාලාව හදාරා අවසන් වූ පසු අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය කිරීමට.

(ඇ) තම ගිවිසුමේ සඳහන් කොන්දේසි සහ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයට හා ප්‍රධාන අධිකාරීන්ට දරන්නට සිදු වූ සියලුම වියදම් ද රජයේ සේවකයෙක් නම් ඊට අමතරව, වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම් ද) ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට පොරොන්දු වීම.

යම් අපේක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑම් කිරීමට හෝ උත්සාහයක් දරණු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුස්සකු බවට පත් වන්නේය.

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

උසස් අධ්‍යාපන අංශය,
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

## ආදර්ශ අයදුම් පත්‍රය

| රු. 10/-වටිනා මුද්දර කොටුව | අංකය :.......................... <br> කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි |
|---|---|

## අධ්‍යාපන අමාත්‍යාංශය
## පොදු රාජ්‍ය මණ්ඩලීය නවසීලන්ත පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව - 2007

1. (අ) මුලකුරු සමග නම (මහතා/මහත්මිය/මෙනෙවිය) :————.
(ආ) මුලකුරුවලින් කියවෙන නම් :————.

2. ලිපිනය :————.
දුරකථන අංකය :————.

3. උපන් දිනය :————.
වර්ෂය :————. මාසය:————, දිනය:————,
2006.05.21 දිනට වයස :————.
වර්ෂ :————.. මාස:————.දින :————.

4. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? :————.

5. විවාහක ද/අවිවාහක ද/වැන්දඹු ද :————.

6. අධ්‍යාපන/වෘත්තීය/කාර්මික සුදුසුකම් :————.

| විභාගයේ/ සහතිකයේ නම | වර්ෂය හා මාසය | ආයතනය | විෂයය | සාමාර්ථයන්ගේ මට්ටම |
|---|---|---|---|---|
| | | | | |

7. දැනට නිරත රැකියාව

| ආයතනයේ නම | දෙපාර්තමේන්තුව | පදවිය | මුල් පත්වීමේ දිනය |
|---|---|---|---|
| | | | |

8. ඔබ රජයේ/විශ්ව විද්‍යාල/සංස්ථාවක සේවකයක් නම්,

(අ) ඔබේ තනතුර ස්ථිරද, *නැතහොත්* තාවකාලිකද :————..
(ආ) ස්ථිර නම්, තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටින්නෙහිද? :————..
(ඇ) තනතුරෙහි ස්ථිර කරනු ලැබූ ලිපියෙහි අංකය, දිනය හා එය නිකුත් කළ බලධාරියා :————.

9. (i) අධ්‍යයනය කිරීමට කැමති පාඨමාලාව හෝ අධ්‍යයන කෙෂ්ත්‍රය:—
(ii) පශ්චාත් හෝ ආචාර්ය උපාධියක් ද? යන වග:———

10. ශ්‍රී ලංකා රජය හෝ ආධාර / අනුග්‍රහය ලබන වෙනත් ආයතනයක් සමග අත්සන් කොට ඇති ගිවිසුම් හා/හෝ බැඳුම්කර ඇත්නම්, ඒ පිළිබඳ විස්තර හා ඒවායින් නිදහස් වීමේ දින.

11. මීට පෙර ශිෂ්‍යත්වයක්, අධ්‍යයන චාරිකාවක්, පුහුණුවක් හෝ වෙනත් එවැන්නක් සඳහා පිටරටකට ගියෙහි නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.:————.

12. ඉංග්‍රීසි මාධ්‍යයෙන් සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය:————.

13. පර්යේෂණ හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු ඇතොත් :————.

14. අනෙකුත් අමතර විස්තර:————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වුත්, නිවැරදි වුත් ඒවා බවද, අවශ්‍ය තොරතුරු කිසිවක් සඟවා නැති බවද මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව තේරීම් කිරීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමට ඉඩ ඇති බවත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ශිෂ්‍යත්ව ප්‍රදානය අවලංගු කිරීමට ඉඩ ඇති බවත් මම දැන සිටිමි.

දිනය :————. ————,
අයදුම්කරුගේ අත්සන.

15. අයදුම්කරු රජයේ අරමුදල්වලින් අනුග්‍රහය ලබන ආයතනයක සේවකයකු නම්:-

## ආයතන ප්‍රධානියාගේ සහතිකය

(1)(අ) ශිෂ්‍යත්වය යටතේ ලබාදෙන පුහුණුව මෙම ආයතනයට අත්‍යවශ්‍ය*/ අත්‍යවශ්‍ය නොවන බවත්,

(ආ) අයදුම්පතෙහි 8,9,11 කොටුවල විස්තර නිලධාරියාගේ පුද්ගලික වාර්තා සමග සංසන්දනය කර බලන ලදුව, ඒවා නිවැරදි*/මෙහි සඳහන් පරිදි නිවැරදි විය යුතු බවත්,

(ඇ) අයදුම්කරු ඔහුගේ*/ඇයගේ පත්වීමෙහි ස්ථිර කර ඇති*/ ......... වැනි දින පත්වීමෙහි ස්ථිර කරනු ලබන බවත්,

(ඈ) ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු*/ඇය සේවයෙන් මුදාහැරිය හැකි*/මුදා හැරිය නොහැකි බවත්,

(ඉ) අයදුම්කරුට වැටුප් සහිත*/වැටුප් රහිත නිවාඩු ප්‍රදානය කරනු*/ නොකරනු ලබන බවත් මෙයින් සහතික කරමි.

(2) අයදුම්කරුගේ සම්පූර්ණ නම:————. (මහතා/මහත්මිය/මෙනෙවිය)
(3) වෙනත් විශේෂ කරුණු ඇත්නම්

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව සමග)

ආයතනයේ නම :————,
දිනය :————.
(මෙම සහතිකය ආයතන ප්‍රධානියා විසින් පෞද්ගලිකවම අත්සන් කළ යුතුයි.)

*අනවශ්‍ය වචන කපා හරින්න.

05-88

---

## අධ්‍යාපන අමාත්‍යාංශය - උසස් අධ්‍යාපන අංශය

### ජපන් (මොන්බුකාගාකුෂෝ) පූර්ව උපාධි ශිෂ්‍යත්ව-2007

2007 අධ්‍යයන වර්ෂය සඳහා ජපාන රජය මගින් පිරිනමනු ලබන පූර්ව උපාධි ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික සිසුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :* -

සෑම අයදුම්කරුවෙකුම.–

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය ;

(ආ) 2007.04.01 වැනි දිනට වයස අවුරුදු 17-21 ත් අතර විය යුතුය ;

(ඇ) ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන ක්ෂේත්‍රයට අදාළ වූ විෂයයන්ගෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද අ.පො.ස (උ.පෙළ) විභාගය සමත් වී තිබිය යුතුය ;

(ඈ) අයදුම්කරුවන් ඉංග්‍රීසි භාෂාව පිළිබඳව ප්‍රවීනතාවයක් ලබා තිබිය යුතුය ;

(ඉ) මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයක පසුවිය යුතුය ;

(ඊ) අයදුම්කරුවන් කිසිවකු රජයේ හෝ රාජ්‍ය ආයතනයක සේවකයෙකු නොවිය යුතුය;

(උ) අයදුම්කරු දැනටමත්, ශ්‍රී ලංකාවේ හෝ පිටරට යම්කිසි විශ්ව විද්‍යාලයක පාඨමාලාවක් සඳහා තෝරාගත් හෝ හදාරන ශිෂයයෙකු නොවිය යුතුය.

(ඌ) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාව වන විට මෙරට විශ්වවිද්‍යාලයක උපාධි පාඨමාලාවක් හැදෑරීමට ලියාපදිංචි වී ඇති කිසිදු අයදුම්කරුවකු නාමයෝජනය සඳහා සලකා බලනු නොලැබේ.

*සටහන* : ජපන් භාෂාව පාඨමාලාවක් ලෙස හැදෑරීම සඳහා වන අයදුම්කරුවන්ට හැර අනෙකුත් අයදුම්කරුවන්ට ජපන් භාෂාව පිළිබඳ දැනුමක් තිබීම අවශ්‍යය නොවේ.

1. ජපන් (මොන්බුකාගාකුෂෝ)-පූර්ව උපාධි ශිෂ්‍යත්ව

1.1 *අධ්‍යයන ක්ෂේත්‍ර* :

(අ) සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍රය, නීතිය, දේශපාලන විද්‍යාව, ශික්ෂණ ශාස්ත්‍රය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, අධ්‍යාපනය, සමාජ විද්‍යාව, සාහිත්‍ය, ඉතිහාසය හා ජපන් භාෂාව

(ආ) ස්වභාවික විද්‍යාව "ඒ"-විද්‍යාව (ගණිතය, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව) විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අධ්‍යයනය, යාන්ත්‍රික හා සිවිල් ඉංජිනේරු විද්‍යාව, වාස්තු විද්‍යාව, රසායනික විද්‍යා අධ්‍යයන හා වෙනත්

ස්වාභාවික විද්‍යාව "බී" -කෘෂිකාර්මික විද්‍යාවන්

ස්වාභාවික විද්‍යාව "සී" වෛද්‍ය විද්‍යාව

අයදුම්කරුවන් ජපන් භාෂාවෙන් පාඨමාලා හැදෑරීමට සූදානම් විය යුතුය. පළමු වසර තුළදී ජපන් භාෂාව පිළිබඳව දැනුම ලබාදෙනු ඇත.

1.2 *තෝරා ගැනීම* .–අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ ජපන් තානාපති කාර්යාලය මගින් පවත්වනු ලබන තරඟ විභාගයක ප්‍රතිඵල මත තෝරාගනු ලැබේ. මෙම විභාගය 2006 ජූලි/අගෝස්තු මාසවලදී පවත්වනු ලැබේ. ගැසට් නිවේදනය අනුව ඉල්ලුම්කර ඇති අයදුම්කරුවන් අතුරින් අ.පො.ස (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵලවල කුසලතා පදනම මත කෙටි ලැයිස්තුගත කිරීමකින් අනතුරුව සම්මුඛ පරීක්ෂණයකට කැඳවීමෙන් තෝරාගන්නා අයදුම්කරුවන් 20 දෙනෙකුගේ නාම යෝජනා, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තරඟ විභාගය සඳහා ඉදිරිපත් කරනු ඇත.

1.3 *පරීක්ෂණය සඳහා වූ විෂයයන්* :

(අ) සමාජ විද්‍යාව හා මානව ශාස්ත්‍රය සඳහා ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් විෂයයන් හතරකට පෙනී සිටිය යුතුය

එනම්-ගණිතය, ඉංග්‍රීසි භාෂාව, ලෝක ඉතිහාය, ජපන් භාෂාව

(ආ) ස්වාභාවික විද්‍යාව "ඒ", "බී", "සී" සඳහා ඉල්ලුම්කර ඇති අයදුම්කරුවන් විෂයයන් පහකට පෙනී සිටිය යුතුය.

එනම්-ගණිතය, ඉංග්‍රීසි භාෂාව, ජපන් භාෂාව සහ භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව යන විෂයයන් අතුරින් තෝරාගත් විෂයයන් දෙකක්,

භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂයයන් අතුරින් තෝරාගත යුතු විෂයයන් දෙක පහත සඳහන් පරිදි විය යුතුය

ස්වාභාවික විද්‍යාව "ඒ" - භෞතික විද්‍යාව හා රසායයන විද්‍යාව
ස්වාභාවික විද්‍යාව "බී" හා "සී" - රසායන විද්‍යාව හා ජීව විද්‍යාව

*සටහන* : ගණිතය පිළිබඳ පරීක්ෂණය, මෙරට අ.පො.ස. උසස් පෙළ සංයුක්ත ගණිත ප්‍රශ්න පත්‍රය හා සමානවේ.

1.4 *ප්‍රදානයන්* :

(අ) ජපානයට යාමට සහ නැවත ඒමට ගුවන් ගමන් පහසුකම්
(ආ) මාසික දීමනාවක්
(ඇ) පැමිණීමේ දීමනාවක්
(ඈ) ඇතුළත්වීමේ විභාග ගාස්තු, පාඨමාලා ගාස්තු යනාදියෙන් නිදහස් කිරීම
(ඉ) නවාතැන් පහසුකම්

(අ) සිට (ඉ) දක්වා සියලු වියදම් ජපන් රජය විසින් දරනු ඇත. ජපානයට පැමිණි විගස දැරිය යුතු හදිසි වියදම් සඳහා ඇමරිකානු ඩොලර් 1500 ක පමණ මුදලක්, අයදුම්කරු විසින් රැගෙන යා යුතුය.

02.ජපානය (මොන්බුකාගාකුෂෝ)-තාක්ෂණ විදුහල :

2.1 *අධ්‍යයන ක්ෂේත්‍රය :*

1 වැනි වර්ගය - යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව
2 වැනි වර්ගය - විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව
3 වැනි වර්ගය -තොරතුරු සන්නිවේදන හා ජාල ඉංජිනේරු විද්‍යාව
4 වැනි වර්ගය - ද්‍රව්‍යමය ඉංජිනේරු විද්‍යාව
5. වැනි වර්ගය - වාස්තු විද්‍යාව හා සිවිල් ඉංජිනේරු විද්‍යාව
6. වැනි වර්ගය - නාවික ඉංජිනේරු විද්‍යාව

අයදුම්කරුවන් ජපන් භාෂාවෙන් පාඨමාලා හැදෑරීමට සූදානම් විය යුතුය. පළමු වසර තුළදී ජපන් භාෂාව පිළිබඳව දැනුම ලබාදෙනු ඇත.

2.2 *තෝරා ගැනීම* :

අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ ජපන් තානාපති කාර්යාලය මගින් පවත්වනු ලබන විෂයයන් දෙකකින් යුත් (ගණිතය සහ භෞතික විද්‍යාව හෝ රසායනික විද්‍යාව) තරඟ විභාගයක ප්‍රතිඵල මත තෝරාගනු ලැබේ. මෙම විභාගය 2006 ජූලි/අගෝස්තු මාසවලදී පවත්වනු ලැබේ. *ගැසට්* නිවේදනය අනුව ඉල්ලුම්කර ඇති අයදුම්කරුවන් අතුරින් අ.පො.ස (උ. පෙළ) විභාගයේ ප්‍රතිඵලවල කුසලතා පදනම මත කෙටි ලැයිස්තුගත කිරීමකින් අනතුරුව සම්මුඛ පරීක්ෂණයකට කැඳවීමෙන් තෝරාගන්නා 35 දෙනෙකුගේ නාම යෝජනා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තරඟ විභාගයට ඉදිරිපත් කරනු ඇත.

*සටහන* : ගණිතය පිළිබඳ පරීක්ෂණය, මෙරට අ.පො.ස. උසස් පෙළ සංයුක්ත ගණිත ප්‍රශ්න පත්‍රය හා සමාන වේ.

2.3 *ප්‍රදානයන්* :

(අ) ජපානයට යාමට හා ආපසු පැමිණීමට ගුවන් ගමන් බලපත්‍ර ;
(ආ) මාසික දීමනාවක් ;
(ඇ) පැමිණීමේ දීමනාවක් ;
(ඈ) ඇතුළත්වීමේ විභාග ගාස්තු, පාඨමාලා ගාස්තු යනාදියෙන් නිදහස් කිරීම ;
(ඉ) නවාතැන් පහසුකම් සැපයීම.

(අ) සිට (ඉ) දක්වා වියදම් ජපන් රජය විසින් දරනු ඇත. ජපානයට පැමිණි විගස දැරිය යුතු වියදම් සඳහා ඇමරිකානු ඩොලර් 1500 ක මුදලක් අයදුම්කරු විසින් රැගෙන යා යුතුය.

03. *අයදුම්පත්* :

(අ) සෑම අයදුම් පත්‍රයක්ම මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරන ලද ඒවා විය යුතුයි

(ආ) අදාළ අයදුම්පතෙහි අධ්‍යයන–ක්ෂේත්‍රයන්, තම මනාපය පරිදි අවරෝහණ පිළිවෙලට සඳහන් කළ යුතුය

(ඇ) විභාගයට පෙනී සිටි වාර ගණන අනුව අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල අයදුම්පතේ වෙන වෙනම සඳහන් කළ යුතුය. අයදුම්කරු විසින් අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ලබාගත් "Z Score" හා එක් එක් විෂයයන් සඳහා ලබාගත් ශ්‍රේණිය අයදුම්පතෙහි නියමිත ස්ථානයේ සඳහන් කළ යුතුය. 2005 වසරේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි අය, නව සංශෝධිත "Z Score" අගය සඳහන් කළ යුතුය.

(ඈ) රු. 10 ක් වටිනා මුද්දරයක් හෝ මුද්දර අයදුම් පත්‍රයේ ඒ සඳහා වෙන්කර ඇති කොටුවේ අලවා, අයදුම්කරු විසින්ම තමාගේ අත්සන යොදා එය අවලංගු කළ යුතුය.

(ඉ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2006.05.31

(ඊ) මෙම නිවේදනයේ කොන්දේසි පූර්ව දැනුම් දීමකින් තොරව ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලබන රටේ කැමැත්ත පරිදි වෙනස් කිරීමට ඉඩ ප්‍රස්ථාව ඇත.

(උ) තෝරාගත් අයදුම්කරුවන් නාමයෝජනය කිරීමෙන් අනතුරු, ශිෂ්‍යත්වය භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලබයි නම් අන් කවර හෝ ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා අදාළ අපේක්ෂකයා පිළිබඳව අනාගතයේදී සලකා බලනු නොලැබේ.

(ඌ) අයදුම්පත්‍රය අඩංගු ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ශිෂ්‍යත්වයේ නම පැහැදිලිව සඳහන් කළ යුතුය.

*උදා* : ජපන් (මොන්බුකාගාකුෂෝ) ශිෂ්‍යත්ව 2007-පූර්ව උපාධි ජපන් (මොන්බුකාගාකුෂෝ) ශිෂ්‍යත්ව 2007-තාක්ෂණ විදුහල

(එ) *ගිවිසුම*

තෝරාගනු ලබන සෑම අපේක්ෂකයෙකුම ශිෂ්‍යත්වය සඳහා පිටත්ව යාමට පෙර ශ්‍රී ලංකා රජය සමග පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය

(i) නියමිත පාඨමාලාව අනලස්ව හදාරා සතුටුදායක ලෙස නිම කර රටට ආපසු පැමිණීමටද,

(ii) පාඨමාලාව හදාරා අවසන් වූ පසු අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා රජය විසින් නියම කරනු ලබන කිසියම් කාල සීමාවක් ශ්‍රී ලංකා රජය යටතේ සේවය කිරීමට ද

(iii) තම ගිවිසුමේ සඳහන් කොන්දේසි සහ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකිවන අවස්ථාවකදී ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම ආපසු ගෙවීමට ද, ශ්‍රී ලංකා රජයට පොරොන්දු විය යුතු ය.

(ඒ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ඒවා ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය.

ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය,
උසස් අධ්‍යාපන අංශය,
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

| මුද්දර කොටුව | ශිෂ්‍යත්වයේ නම :...................... |
|---|---|

(කරුණාකර ශිෂ්‍යත්වයේ නම සඳහන් කරන්න "පූර්ව උපාධි" හෝ "තාක්ෂණික විදුහල" ලෙස)

අධ්‍යාපන අමාත්‍යාංශය-උසස් අධ්‍යාපන අංශය.

2007 වර්ෂය සඳහා ජපන් (මොන්බුකාගාකුෂෝ) ශිෂ්‍යත්ව අයදුම් පත්‍රය

01. සම්පූර්ණ නම : ————, ස්ථවිර/මයා/මෙනෙවිය
මුලකුරු සමග නම : ————,

02. ලිපිනය : ————,

දුරකථන අංකය : ————, දිස්ත්‍රික්කය : ————,
(අත්‍යාවශ්‍යයි.) ජාතික හැඳුනුම්පත් අංකය : ————,

03. උපන් දිනය :
වර්ෂය : ——, මාසය : ——, දිනය : ——.

04. වයස 2007.04.01 දිනට : වර්ෂ : ——,මාස : ——,දින : ——.

05. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද ? : ————,

06. විවාහක/අවිවාහක බව : ————,

07. උපන් ස්ථානය : ————,

08. තමන් කැමති පාඨමාලාව/පාඨමාලා/අධ්‍යයන ක්ෂේත්‍රය : ————,

09. අයදුම්කරුගේ පවුලේ වෙනත් අයෙකු ලබා ඇති ශිෂ්‍යත්ව පිළිබඳ විස්තර (තිබේ නම්) : ————,

| *ස්වභාවය* | *රට* | *ප්‍රදානය කරනු ලැබූ දිනය* | *ඉල්ලුම්කරුට ශිෂ්‍යත්වලාභියාගේ ඇති ඥා.ති සම්බන්ධකම* |
|---|---|---|---|
| ………… | ………… | …………… | …………………… |

10. *අධ්‍යාපන සුදුසුකම්* :

| *විභාගයේ නම* | *වර්ෂය හා මාසය* | *පාසල* | *විභාග අංකය* | *විෂයයන්* | *ශ්‍රේණිය* |
|---|---|---|---|---|---|
| අ.පො.ස (සා.පෙළ) | | | | 1.<br>2.<br>3<br>4.<br>5.<br>6.<br>7.<br>8.<br>9.<br>10. | |
| අ.පො.ස (උ.පෙළ) | | | | 1.<br>2.<br>3.<br>4. | |
| ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාව/Z Score : | | | | | |

11. ඉංග්‍රීසි භාෂාවෙන් සමර්ථ වී ඇති ඉහළම විභාගය :————,

12. ඔබ දැනටමත් ශ්‍රී ලංකාවේ හෝ පිටරට යම්කිසි විශ්වවිද්‍යාලයක පාඨමාලාවක් සඳහා තෝරාගත් හෝ හදාරන අයෙක්ද ? පිළිතුර 'ඔව්' නම් කරුණාකර විස්තර සපයන්න :————,

මෙම අයදුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවරදි බවත්, මා කිසියම් අවශ්‍ය තොරතුරක් සඟවා නොමැති බවත්, මින් සහතික කරමි. මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරක් සාවද්‍ය බවට හෙළිදරව් වුවහොත් තෝ ගැනීමට පෙර මා නුසුදුස්සෙකු බවට පත්වන අතර, ප්‍රදානය සඳහා තෝරා ගැනීමෙන් අනතුරුව වුව ද මා නුසුදුස්සෙකු බවට පත්වන අතර, ප්‍රදානය ඉවත් කිරීමට හැකි බව ද මම අවබෝධ කරගෙන සිටිමි.

දිනය :————, ————,
අයදුම්කරුගේ අත්සන

05-25

## වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය

### ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
### ඉංජිනේරු තාක්ෂණ ආයතනය (පෙර තා. පු. ආ) - කටුනායක

### ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම - 2006 කණ්ඩායම

කටුනායක, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ (පෙර තාක්ෂණඥයින් පුහුණු කිරීමේ ආයතනයේ) ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව, 2006 කණ්ඩායම සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම පිණිස ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

පහත දක්වා ඇති සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

1.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී එකවර විෂයයන් 06 කින් සාමාර්ථය ලබා සිටිය යුතු අතර, එසේ සාමාර්ථය ලැබූ විෂයයන්ගෙන් 03 කට සම්මාන සාමාර්ථය ලබා සිටීම හා එම විෂයයන් විද්‍යාව, ගණිතය සහ භාෂාව වීම ;

සහ

1.2 (i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ - පැරණි නිර්දේශය) විභාගයේදී ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව යන විෂයයන් තුන (03) එකවර සමත් වීම;

හෝ

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ - පැරණි නිර්දේශය) විභාගයේ දී ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් හතර (04) වාර දෙකක දී සමත් වීම ;

හෝ

(iii) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ - නව නිර්දේශය) විභාගයේ දී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් තුන (03) එකවර සමත්වීම.

2. *වයස* .– 2006.12.01 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 25 ට නොවැඩි විය යුතුය.

3. පුහුණු කිරීමේ කාලය පිළිබඳ වැඩසටහන් විස්තර :

මෙම පාඨමාලාවේ කාලය වසර හතරකි. සති 73 ක (ආසන්න වශයෙන්) න්‍යායික උපදෙස් පාඨමාලාව, සති 135 ක (ආසන්න වශයෙන්) ප්‍රායෝගික පුහුණුව සමග පහත දැක්වෙන ආකාරයට සකස් කර ඇත.

| | |
|---|---|
| මූලික උපදෙස් වැඩසටහන (කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව සහිතව) | |
| ඉංජිනේරු තාක්ෂණ ආයතනයේදී | –සති 27 |
| මූලික කාර්මික පුහුණුව කාර්මික ආයතනයේදී | –සති 39 |
| සාමාන්‍ය උපදෙස් වැඩසටහන ඉ. තා. ආයතනයේදී | –සති 23 |
| සාමාන්‍ය කාර්මික පුහුණුව කාර්මික ආයතනයේදී | –සති 52 |
| විශේෂ උපදෙස් වැඩසටහන ඉ. තා. ආයතනයේදී | –සති 23 |
| විශේෂ කාර්මික පුහුණුව කාර්මික ආයතනයේදී | –සති 44 |

මෙම ඉංජිනේරු පාඨමාලවට අයත් න්‍යායික උපදෙස් හා පාඨමාලා ප්‍රායෝගික කාර්යයන් මෙම ආයතනයේ දී ලබා දෙන අතර කාර්මික පුහුණුව පිළිගත් කර්මාන්ත ආයතන මගින් ලබා දෙනු ඇත.

4. ආයතනය මගින් පවත්වනු ලබන පාඨමාලා පහත සඳහන් පරිදි වේ :

1. ගොඩනැගිලි හා ව්‍යුහ ඉංජිනේරු ;
2. මහා මාර්ග හා දුම්රිය මාර්ග ඉංජිනේරු ;
3. ජල හා පාරිසරික ඉංජිනේරු ;
4. විද්‍යුත් ඉංජිනේරු ;
5. විදුලි බල ඉංජිනේරු ;
6. විදුලි සංදේශ ඉංජිනේරු ;
7. යාන්ත්‍රික (ස්වයංචලන) ඉංජිනේරු ;
8. යාන්ත්‍රික (සාමාන්‍ය) ඉංජිනේරු ;
9. නාවික ඉංජිනේරු.

(අ) ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ නාවික ඉංජිනේරු පාඨමාලාව (අංක 9) තත්ත්ව කළමනාකරණ පද්ධතිය ISO 9001-2000 හි දක්වා ඇති අවශ්‍යතා පරිදි පැවැත්වේ.

(ආ) නාවික ඉංජිනේරු පාඨමාලාව සැලසුම් කොට ඇත්තේ අන්තර්ජාතික සමුද්‍ර සංවිධානයේ STCW— 95 සහ 7.04 ආදර්ශ පාඨමාලාව හා සම්බන්ධිත නාවික ඉංජිනේරු කාරක මට්ටමේ දැනුම, අවබෝධය සහ ප්‍රවීණතාව පිළිබඳ විධානානුකූල අවශ්‍යතා සපුරාලනු පිණිස වේ.

5. *උපදෙස් මාධ්‍යය* .- මෙම පාඨමාලා පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි භාෂාවෙනි.

6. *ආධුනිකත්ව ගිවිසුම* .–

6.1 තෝරාගනු ලබන සෑම ආධුනිකයෙකු විසින්ම ආධුනිකයා, ඉංජිනේරු තාක්ෂණ ආයතනය සහ පුහුණු කිරීමේ ආයතනය යන තිදෙනා වෙතම අන්‍යොන්‍යය වගකීම් පැවරෙන විශේෂ ආධුනිකත්ව ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේ දී පාඨමාලාව අවසානයේ ආපසු ගෙවනු ලබන රු. 5000 ක තැන්පතු මුදලක් ලබා දිය යුතුය. (සමෘධිලාභීන්ට මෙය ආදාළ නොවේ.) පාඨමාලාව අතරමග හැර යන සිසුන්ට මෙම මුදල ආපසු ගෙවනු නොලැබේ.

6.2 කර්මාන්ත පුහුණු අවස්ථාවල දී ආධුනිකයා සහ පුහුණු ආයතනය අතර ආධුනිකත්ව ගිවිසුමකට ඇතුළත් විය යුතුය

6.3 පුහුණුව අවසාන වීමෙන් පසුව ආධුනියකයන් සඳහා රැකියා සැපයීමට ආයතනය බැඳී නොමැත.

6.4 මෙම පාඨමාලා සඳහා ලියාපදිංචි වන සියළුම සිසුන් මුළු පාඨමාලා කාලය තුළ 80% අවම පැමිණීමේ ප්‍රතිශතයක් පවත්වා ගෙන යා යුතුය. එසේ නොවන අවස්ථාවලදී අදාළ විභාගවලට පෙනී සිටිය නොහැකි අතර ඔවුන්ට එම කණ්ඩායමෙන් ඉවත් වී පසු කණ්ඩායම සමග අධ්‍යයන කටයුතු කිරීමට සිදුවේ.

7. *සහතික ප්‍රදානය* .–

සාර්ථක ලෙස පුහුණුව අවසන් කර සමත්වන ආධුනිකයින්හට ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතිකය ප්‍රදානය කරනු ඇත.

8 *තෝරාගැනීමේ ක්‍රමය* :

8.1 ඉහත අංක 1 ජේදයෙහි සඳහන් ඇතුළත් කරගැනීම සඳහා වූ අවම සුදුසුකම් සහිත අංක 2 ජේදයෙහි සඳහන් වයස සීමාව තුළ වූ අයදුම්කරුවන්ගෙන් පහත දැක්වෙන ක්‍රමයට තෝරාගැනීම සිදුකරනු ලැබේ.

8.2 අංක 8.1 හි සඳහන් පරිදි මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අයදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් වූ ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. (ලිඛිත යෝග්‍යතා පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන සියලුම අයදුම්කරුවන් වෙත කල් වේලා ඇතිව ඒ බව දැනුම් දෙනු ලැබේ)

8.3 ලිඛිත පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු හා සම්මුඛ පරීක්ෂණයක් මගින් (අංක 4 හි සඳහන්) විවිධ ක්ෂේත්‍ර /විශේෂීකරණ සඳහා ආධුනිකයින් තෝරාගනු ඇත.

8.4 නාවික ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් ඔවුන් එම ක්ෂේත්‍රයේ ලියාපදිංචි වීමට පෙර ඔවුන්ගේ වියදමින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

9. *අයදුම්පත්* :

9.1 අයදුම්පත්, පාඨමාලා සහ ආයතනය පිළිබඳ වැඩි විස්තර www.ndes.lk යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක. තවද,

9.2 කටුනායක, පන්සල පාරේ, ඉංජිනේරු තාක්ෂණ ආයතනයට පැමිණ රු. 50 ක් ගෙවීමෙන් හෝ තැපැලෙන් අවශ්‍ය නම් රු. 50 ක් වටිනා මුදල් ඇණවුමක් සහ මුද්දර ගැසූ ලිපිනය ලියන ලද අඟල් 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවරයක් ලේඛකාධිකාරි, ඉංජිනේරු තාක්ෂණ ආයතනය, පන්සල පාර, කටුනායක (011-2252833 - 011-2252834) යන ලිපිනයට එවීමෙන් 2006 ජුනි 20 වැනි දින දක්වා අයදුම්පත් ලබාගත හැක.

9.3 මෙයට අමතරව පහත දැක්වෙන ප්‍රධාන කාර්යාලය, ජාතික ආයතන සහ පළාත් කාර්යාලවලට පැමිණ රු. 50 ක් ගෙවීමෙන්ද 2006 ජුනි 20 වැනි දින දක්වා අයදුම්පත් මිලදී ගත හැක.

(i) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය. 011-2863680, 011-2867435

(ii) ආධුනිකත්ව අභ්‍යාස ආයතනය, 581, ගාලු පාර. කටුබැද්ද, මොරටුව, 011-2647393, 011-2641092

(iii) මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, 07, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය. 011-2572977, 011-2532182

(iv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, ඌව පළාත් කාර්යාලය, 288, කුමාරසිංහ මාවත, පස්සර පාර, බදුල්ල. 055-2222608

(v) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය. සබරගමුව පළාත් කාර්යාලය, නව කොළඹ පාර, විද්‍යාල මාවත, නව නගරය, රත්නපුර 045-2228667

(vi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, දකුණු පළාත් කාර්යාලය, 27ඒ, විවෘත විශ්ව විද්‍යාල මාවත, නූපේ, මාතර. 041-2226958

(vii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය. අංක 108/2 බී, තිවංක බෝධි මාව, මුල්ගම්පොළ, මහනුවර 081-2201918

(viii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, උතුරු මැද පළාත් කාර්යාලය, දෙවන පියවර, 525/2, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුරය –025-2225504

(ix) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, වයඹ පළාත් කාර්යාලය, ජාතික තරුණ සේවා සභාව අසල, මීගමුව පාර, මල්කඩුවාව, කුරුණෑගල –037-2223789

(x) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, උතුරු පළාත් කාර්යාලය, 07, කෝවිල පාර, යාපනය–021-2222383

(xi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, නැගෙනහිර පළාත් කාර්යාලය, 161 ඒ, යාසින් ගොඩනැගිල්ල, ප්‍රධාන පාර, කල්මුනේ. –067-2229357

(xii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, බස්නාහිර පළාත් කාර්යාලය, 242, හැව්ලොක් පාර, කොළඹ 05. 011-2597671 - 2, 011-2587258

9.4 සිය අයදුම්පත ඉහත ආයතන වලින් ලබා ගන්නා සෑම අයදුම් කරුවෙකු විසින්ම එම ඉදිරිපත් කිරීමේදී රු. 200 ක මුදලක් (9.6 ප්‍රකාර) ගෙවිය යුතුය. මෙම මුදල දිවයිනේ පිහිටි මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට ගෙවිය හැකිය.

9.5 අයදුම්පත් වෙබ් අඩවියෙන් ලබා ගෙන එම අයදුම්පත මගින් ඉල්ලුම් කිරීමේදී අදාළ අයදුම්කරුවන් රු. 250 ක මුදල් (9.6 ප්‍රකාර) මහජන බැංකුව වෙත ගෙවිය යුතුය.

9.6 මුදල් තැන්පතු තුණ්ඩුව පහත සඳහන් කරුණු සහිතව නිසි පරිදි සම්පූර්ණ කළ යුතුය.

(i) ශාඛා අංකය සහ ගිණුම් අංකය - 0174 - 1010089204

(ii) බැර උපදෙස් - මහජන බැංකුව, නුගේගොඩ, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ රැස් කිරීමේ ගිණුම් අංක 0174 -1010089204 ට බැර පිණිස.

(iii) අයදුම්කරුගේ නම සහ ලිපිනය :

9.7 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, මුදල් ගෙවීම් කරන ලද බැංකු ශාඛාවේ බලයලත් නිලධාරියෙකු විසින් සහතික කරන ලද තැන්පතු රිසිට්පත අයදුම්පත සමග අමුණා 2006 ජූනි 22 වැනි දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ/විදුහල්පති, ඉංජිනේරු තාක්ෂණ ආයතන, පන්සල පාර, කටුනායක යන ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හෝ අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

9.8 රජයේ කාර්මික ආයතනයක හෝ විශ්ව විද්‍යාලයක පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ උපාධිය හැදෑරූ හෝ හදාරමින් සිටින අය හෝ අයදුම් කිරීමට සුදුසුකරුවන් නොවේ.

9.9 අයදුම්පත සමග සහතික වල මුල්පිටපත් හෝ පිටපත් හෝ එවිය යුතු නැත.

9.10 අයදුම්පත් ලැබුණු බවට අයදුම්කරුවන්ට දැනුම් දෙනු නොලැබේ.

9.11 ඉහත අංක 9.2 හි සඳහන් මුදල් ඇණවුම ගණකාධිකාරී, ඉංජිනේරු තාක්ෂණ ආයතනය නමින් ලබාගත යුතු අතර ගෙවීම් කරන තැපැල් කාර්යාලය කටුනායක විය යුතුය.

10. තැපෑලේ දී නැතිවන හා ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධයෙන් ඉංජිනේරු තාක්ෂණ ආයතනය වග කියනු නොලැබේ. ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල් ඇතිව සිය අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට විශේෂයෙන් දන්වා සිටිනු ලැබේ.

සභාපති,
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය.

අංක 971,
ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ,
රාජගිරිය.

05-16

---

## ඕෆ්සෙට් ලිතෝකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව (පූර්ණ කාලීන)

### ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ඒකාබද්ධව ක්‍රියාකරනු ලබන පුහුණු වැඩ සටහන

අද දිවයිනේ ඉහලම ඉල්ලුමක් ඇති ඕෆ්සෙට් මුද්‍රණකරුවන් බිහිකිරීමේ අභිලාෂයෙන් පාසැල් හැරගිය ළමුන් සඳහා මෙම පාඨමාලාව හඳුන්වා දෙන අතර අයදුම්පත් කැඳවීම දැන් ආරම්භ කර ඇත.

විෂය මූලිකය.– ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography), Sheet Feeder සහ Stream Feeder යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුළු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව.

පුහුණු කාලය.– මාස 14 යි (පූර්ණ කාලීන).

අවම සුදුසුකම්.– අ. පො. ස (සා. පෙ.) සමත් වයස අවුරුදු 18 ට සහ 22 අතර ශ්‍රී ලාංකික පුරවැසියන්.

පුහුණු ක්‍රමය.– මාස 2ක කාලයක් පූර්ණ කාලීන මූලික ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම ලබාදීම ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ සිදු කෙරේ.

ඉන් අනතුරුව මාස 12ක් මුද්‍රණාලයකට අනුයුක්ත කොට පූර්ණ කාලීන ප්‍රායෝගික පුහුණුවක් ලබාදෙන අතර මෙම කාලය තුළ සෑම දෙසතියකට වරක් පුරා දවසක් වෘත්තිය පුහුණු අධිකාරියේ පිහිටි මුද්‍රණ පාසැලේ නව මුද්‍රණ යන්ත්‍ර ආශ්‍රිතව ප්‍රායෝගික දැනුම වර්ධනය වන අයුරින් විශේෂ එක් දින පංති (Day School) පැවැත්වේ. ඊට අමතරව සතියකට වරක් න්‍යායාත්මක පංති ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පැවැත්වේ.

මාධ්‍යය .– සිංහල
පාඨමාලා ගාස්තු.– රු. 15,000යි
තෝරා ගැනීම.– සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව
ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනය .- 2006 මැයි 15

විමසීම්.– ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
දුරකථන.– 2686162/2679791
ෆැක්ස් අංකය.– 2686162 ඊ මේල් sliopreg@sri.lanka.net

05 - 126

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

## 1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත ඩිපිටපතඩ් කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* - (වාර්ෂික)

| | මෙරට රු. ශ. | පිටරට රු. ශ. |
|---|---|---|
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 0 | 2,098 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 0 | 745 0 |
| I වන ඡේදය | 520 0 | 1,007 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 0 | 1,009 0 |
| III වන ඡේදය | 468 0 | 907 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 0 | 4,422 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිළ ගාස්තුව රු. ශ. | තැපැල් (මෙරට) රු. ශ. |
|---|---|---|
| (අ) I වන කොටස | 31 0 | 5 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 0 | 5 0 |
| (ආ) I වන ඡේදය | 10 0 | 5 0 |
| II වන ඡේදය | 12 0 | 5 0 |
| III වන ඡේදය | 9 0 | 5 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01 ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැලකිය යුතුයි.*- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2006** | | | |
| මැයි | 2006.05.05 | සිකුරාදා | 2006.04.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.05.11 | බ්‍රහස්පතින්දා | 2006.04.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.05.19 | සිකුරාදා | 2006.05.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.05.26 | සිකුරාදා | 2006.05.11 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| ජුනි | 2006.06.02 | සිකුරාදා | 2006.05.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.06.09 | සිකුරාදා | 2006.05.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.06.16 | සිකුරාදා | 2006.06.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.06.23 | සිකුරාදා | 2006.06.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.06.30 | සිකුරාදා | 2006.06.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2006.07.07 | සිකුරාදා | 2006.06.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.07.14 | බදාදා | 2006.06.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.07.21 | සිකුරාදා | 2006.07.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.07.28 | සිකුරාදා | 2006.07.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.